පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.21 පැය 1810 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/113/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


.

## අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගෝනහේන පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුර.

වැඩබලන පොලිස්පතිතුමාගේ උපදෙස් මත දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පොලිසිය සිදු කරගෙන යනු ලබන අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුමට අදාලව 2025.01.21 වන අද දින දහවල් කාලයේ හංවැල්ල පොලිස් වසමේ නිරිපොල ප්‍රදේශයේදී, ගෝනහේන පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන් කණ්ඩායමකට ලද තොරතුරක් අනුව වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 02 කට ආසන්න ප්‍රමාණයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන හංවැල්ල පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

අයිස් මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගන්නා ලද බවට සැකකරන රුපියල් ලක්ෂයක (රුපියල් 100,000) මුදලක්ද සැකකරු සන්තකයේ තිබී පොලිස් භාරයට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වන හංවැල්ල, නිරිපොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

විදේශ රටක සිට මෙරට මත්ද්‍රව්‍ය ජාලය මෙහෙයවනු ලබන සංවිධානාත්මක අපරාධකරුවෙකු විසින් මෙම අයිස් මත්ද්‍රව්‍ය තොගය ජාවාරම් කිරීම සඳහා මෙම සැකකරු වෙත ලබාදී ඇති බවට දැනට සිදුකරන ලද විමශර්නයට අනුව අනාවරණය වී ඇත.

හංවැල්ල පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**